**වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමඟ එකී ගිණුම් පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ උපකල්පන පිළිබඳ සටහන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිගණක හා උපාංග යටතේ ගිණුම්ගත කළයුතු රු.847,620 ක් වටිනා පරිගණක හා අමතර කොටස් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) වාහන යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියා හා නඩත්තු යන වැය ශීර්ෂයට හර විය යුතු රු.38,464 ක රක්ෂණය කිරීම සඳහා වැය වූ වියදම සේවා සඳහා රජයේ ආයතනවලට ගෙවීම් ලෙස දක්වා තිබුණි.

(ඇ) 2012 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ ලැබ තිබූ රු.1,030,312 ක් ලැබිය යුතු සේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

--------------------------

ගිණුම් විෂයයන් 03 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.4,056,658 ක වෙනසක් පැවතුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.52,019,810 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, ලියාපදිංචි සහතික සහ ශේෂ සනාථ කිරීමේ සහතික පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.361,468 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,150,951 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

---------------------

**2.2.1 අක්කර බදු**

-------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගත යුතුව තිබූ රු.141,925 ක අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.2 බදු කුලී**

---------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගත යුතුව තිබූ රු.263,935 ක් වූ බදු කුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.169,416 ක උසාවි දඩ හා රු.4,962,599 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

**වත්කම් වගකීම් නීත්‍යානුකූලව පවරා නොතිබීම**

-------------------------------------------------

වත්කම් බැරකම් බෙදාදීමේ කමිටුවේ නිර්දේශ මත කරන්දෙණිය ප්‍රාදේශීය සභාව විසින් වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවට පැවරිය යුතු ලෙසට තීරණය කර තිබූ රු.4,606,306 ක වත්කම් සහ රු.2,740,757 ක බැරකම් පාදක කරගෙන ගිණුම් පිළියෙල කර තිබුණ ද, විගණන දිනය වූ 2015 අප්‍රේල් 11 දින වනවිටත් අදාළ වත්කම් හා වගකීම් නීත්‍යානුකූලව ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

### 3.2.1 වීථි පහන් උපකරණ මිලදී ගැනීම

-------------------------------------

2014 වර්ෂය තුළ වීථි පහන් උපකරණ මිළදී ගැනීම වෙනුවෙන් රු.518,750 ක් වැයකර තිබූ අතර, වීථි පහන් නඩත්තුව සඳහා රු.840,064 ක් වැයකර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) වීථි පහන් සවි කිරීම පිළිබඳ උපදෙස් දැක්වෙන වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ 1998 මාර්තු 16 දිනැති අංක : පී.එෆ්ග/12/91 දරන චක්‍රලේඛය අනුව වීථි පහන් අළුතින් ස්ථාපිත කිරීමට පෙර ඒ පිළිබඳව අනුමැතිය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් ලබා ගතයුතු වුවද, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව වීථි පහන් සවි කර තිබුණි.

(ii) ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(iii) බලප්‍රදේශයේ නඩත්තු කරන වීථි පහන් පිළිබඳ විස්තර දැක්වෙන ලේඛනයක් සකස් කර නොතිබුණි. වීථි පහන් නඩත්තුව සඳහා උපාංග නිකුත් කිරීමේ දී අදාළ නිශ්චිත විදුලි පහන් හඳුනා ගැනීම තුළින් එය සිදු නොකරන බැවින් ඒ ඒ වීථි පහන් සඳහා සවි කරන ලද උපාංගවල කල් පැවැත්ම සලකා බැලීමේ ක්‍රමවේදයක් නොතිබුණි.

## 3.3 ඌන උපයෝජිත වත්කම්

------------------------------

### LK-9588 දරන ටිපර් රථය

------------------------------

පුර නැගුම ව්‍යාපෘතිය යටතේ 2013 සැප්තැම්බර් 11 දින අංක : LK – 9588 දරන ටිපර් රථය සභාවට ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කියුබ් 2.5 ක ධාරිතාවයකින් යුතු වූ මෙම ටිපර් රථය සභා බලප්‍රදේශය තුල පවතින පටු මාර්ග වල ධාවනය කිරීමට නොහැකි / අපහසු තත්ත්වයන් පැවතීම නිසා සංවර්ධන හා සුභසාධන කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) 2014 වර්ෂය තුළදී ටිපර් රථය කුලියට ලබා දීමෙන් රු.128,000 ක කුලී ආදායමක් ලබාගෙන තිබුණ ද, ඉන්ධන වියදම් ලෙස රු.76,368 ක් ද, අනෙකුත් වියදම් රු.90,672 ක් ද වශයෙන් එකතුව රු.167,040 ක් වැයකර තිබුණි. ඒ අනුව ටිපර් රථයේ මෙහෙයුම් කටයුතුවලින් 2014 වර්ෂය තුළ සභාවට රු.39,040 ක පාඩුවක් සිදුව තිබුණි.

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**අයවැය පාලනය**

-------------------

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ආදායම් අතර විචලනයන් පවතින බවත්, ඇතැම් වියදම් විෂයයන්වල ඉතිරි කිරීම් තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**5.** **පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය